# LMFPA News Bulletin

January | February 2022

## LMFPA Database on Fraudulent Employees

The LMFPA database on fraudulent employees has now grown to 186 entrees. During 2021 04 member organizations shared details of 17 ex-employees. And during last year we had a total of 303 inquiries from members requesting information from the database and there were 03 match-es from these inquiries. We appreciate our members who make good use of this free service offered by LMFPA and therefore if your organization has not provided us any information of your former employees whose services were terminated due to fraudulent and/or disciplinary grounds please send us their information. If there are ex-employees against whom you have taken legal action subsequent to their resignation, these too are welcome to our database. The information you provide will be kept at LMFPA in strict confidence. Whenever there is an inquiry that matches a name in the database, LMFPA will only provide the contact information of the MFI that provided us the information to the inquiring member. The inquiring MFI can then contact the other MFI for further information before they make an informed decision on recruitment. The format to send details regarding fraudulent employees can be obtained through email (info.lmfpa@microf-inance.lk)

## Update on Micro inance Helpline





The Microfinance Helpline that was launched last year was established for the purpose of addressing grievances faced by microfinance clients and to persuade the stakeholders to take timely corrective measures for such grievances. Thereafter, the LMFPA with the generous sponsorship from Stromme Micro Credit launched a Public Relations Campaign on promoting the Microfinance Helpline through Electronic Media in October, A Poster Campaign at GN level in 7 districts in November and through Social Media in January this year.

Since the launch of the Microfinance Helpline in August 2021, we received moderate responses from the public. Therefore LMFPA launched a media campaign with the financial support of Stromme Micro Credit in order to create more awareness on the Helpline. The first stage was Television crawlers on Derana TV and Vasantham TV in October 2021. Thereafter we conducted a poster campaign at the village level in the districts of Hambantota, Batticaloa, Anuradhapura, Polonnaruwa, Trincomalee, Jaffna and Kurunegala. More than 14,000 posters were distributed to GN offices, Samurdhi Banks, Economic Development offices and Divisional Secretariats. The last stage was on Social Media predominantly Facebook that began in January this year.

The summary of the calls related to microfinance loans as depicted in the chart below shows that the majority of calls received (65%) were of requests to extend a grace period to settle off existing

loans while 32% of the calls received were requests to waive off penalty charges due to delays in loan repayments. Complaints regarding harassments were very minimal (2%) and none of them caused by a member organization of LMFPA.




## LMFPA Online Webinar on Collection Process after COVID 19

The Lanka Microfinance Practitioners' Association (LMFPA) kick started its training series for 2022 with a webinar entitled "Collection Process after COVID 19" on the 1st of February 2022 via ZOOM. The session was moderated by Development Consultant and Hony. Secretary of LMFPA, Mr. Imran Nafeer. The discussion panel was represented by the following persons of respective member organizations:

- Mr. Amal Dissanayake – Operations Manager - Berendina Micro Investment Company
- Mr. Mahinda Tissa – Assistant General Manager – HNB Finance PLC
- Mrs. Shriyani Mangalika – Managing Director – Hambantota Women's Development Federation
- Mr. Ruwan Rathnasinghe – Head of Retail Operations – Sejaya Micro Credit
- Mr. Ransith De Mel – Head of Operations – ECLOF Lanka




The programme was attended by more than 100 participants representing Microfinance Institutions and other stakeholders in the industry and was sponsored by the generosity of Arthavida Intermediary Ltd, Berendina Micro Investment Company, ECLOF Lanka, HNB Finance, Lak Jaya Microfinance, Sejaya Micro Credit and South Asia Partnership. The discussion took place in the Studio of Perfect Media Network (Pvt) Ltd in Kesbewa.

The first discussion round was on challenges on recoveries and operations post lockdown. The main challenge for MFIs during the pandemic was restrictions on their field staff to reach out to their clientele to provide microfinance services due to the intermittent lockdowns that prevailed in the country. The livelihoods of many microfinance clients were severely affected due to the pandemic and therefore the ability to fulfill their loan obligations to the MFIs was challenged. Many MFIs resort to providing loan moratoriums and other relief facilities to their clients during this time to ease their loan repayment efforts. In addition to this, MFIs also took measures to provide relief packages such as food rations and other amenities for clients who had difficulties in providing basic household necessities.  Furthermore MFIs also assisted in providing safety products like face masks, sanitizers to their clients who could not afford them.




The second round was focused on the demand for loans. It was observed that there had been a high demand for consumption loans by microfinance clients as they had lost their livelihoods due to the lockdowns and were desperate for income to maintain their households. The general practice of MFIs is to provide financial services for income generation activities of their clients so that they have the capacity to repay their loans. However, due to the pandemic and the lockdowns, many microfinance clients loss their source of income and thereby their livelihood and it became a challenge for both them and the MFIs regarding financial sustainability. Provision of consumption loans needed to be handled on a case by case basis so that the client will not be overwhelmed with credit. The long debate regarding multiple loans and over indebtedness was also address here, and the panelists confirmed from their experience that there had been an increase in multiple loans during this time. Many people have also resorted to pawning their jewelry to meet their day to day expenses.  On the perspective of the MFIs, catering to a high demand for loans from their clients posed a challenge to the MFIs that were cash strapped due to several months of inactivity that curtailed the regular cash flow. The other challenge for MFIs is being more vigilant on their credit evaluations as clients may give various reasons to obtain some form of credit for their day to day needs instead of income generation activities.




The final discussion round was focused on Individual and collective measures for the betterment of the industry. Here the panelists shared their views on the level of community service that an MFI provides in the industry. A majority of its profits are channeled back to its operations as well as philanthropic activities.

Despite this, MFIs pay very high taxes every year. Therefore there must be some mechanism to reward MFIs that engage in Corporate Social Responsibility (CSR) projects by providing them with tax credits. This will encourage the MFI to engage in more similar projects in addition to their daily operations and encourage other MFIs also take similar actions thus creating an environment of socially responsible organizations.

Another important factor that was discussed was the absence of monitoring the credit history of microfinance clients. Gaining access to the Credit Information Bureau (CRIB) even for licensed MFIs is long overdue and the credit evaluation process of clients can be smoothened if this access was granted. The regulation of micro credit and its importance was also addressed by the panelists.

Another area that needs the attention of the government is the accessibility to bulk lending opportunities for MFIs. Obtaining funding has been a challenge for MFIs as of late, whether from commercial banks or foreign sources. The reactivation of former bulk lending facilities by state banks and other forms of funding opportunities would create the much needed impetus for MFIs in their outreach of the grassroots level.

Another important factor that was discussed was the evolution of the microfinance industry. Over the past 25 years the scope of the industry has changed dramatically. The adoption process of MFIs according to the changing demand of their clients over time is sometimes questionable. Today microfinance has become more commercialized and the focus of uplifting the living standards of low income households has evolved into simply lending and recovering of loans by MFIs. This mission drift needs to be addressed and duly changed to its former glory. The adoption of digital financing in many MFIs is still at its teething stage as organizations are looking for cost effective strategies for their sustainability in the industry. While embracing technology for smoother operations, MFIs should also focus on improving the financial literacy of their clients especially those of younger ages so that they can make sound financial decisions in their lives.

# අත නොහැරි උත්සාහය

මීට වසර 8 කට පෙර ඉතා කුඩාවට ආරම්භකල සිල්ලර වෙළඳසැල අදවන විට වැඩි දියුණු කර ගනිමින් කුඩා ව්‍යාපාරයක් බවට පත්කර ගැනීමට ක්‍රිෂානි සංජීවනීට හැකි විය. විටින් විට කඩාවැටෙමින් නැවත නැවත උත්සාහය අත නොහරමින් ඉදිරියටම ගිය ඇගේ ජීවිතය ආදර්ශවත් යටගියාව පරිපූර්ණ වී තිබූවකි.

ස්වාමි පුරුෂයා පෞද්ගලික ආයතනයක අනියම් සේවකයකු ලෙස රැකියාවක් කලද එම රැකියාව ස්ථිර රැකියාවක් නොවීම ඇයගේ සිල්ලරකඩ ව්‍යාපාරයට පාදක වී ඇත.

කොන්ත්‍රාත් පදනම තුල කල රැකියාව අවස්ථා කිහිපයක දී කාලයෙන් කාලයට රැකියාව අහිමිවීමෙන් ඇතිවූ ආර්ථික අස්ථාවරභාවය නිසාවෙන් 2013 වර්ෂයේද දී ඉතා කුඩාවට සිල්ලර කඩය ලෙස ආරම්භකරන්නට යෙදී ඇත.

අද වන විට ග්‍රොසරියක් දක්වා වැඩි දියුණු කරගත හැකා වූ වෙළඳ සැල වැඩි දියුණු කරගැනීමේ අදහසින් 2018 වර්ෂයේ දී සවුත් ඒෂියා පාර්ට්නර්ෂිප් ආයතනයේ (සැප් ශ්‍රී ) මූලිකත්වයෙන් පිහිට වූ තලාපිටිය සුළු හා මධ්‍ය පරිමාණ ඛව්‍යවසාය සංවර්ධන අරුනළු සමිතියේ ආරම්භක සාමාජිකත්වය ලබා ගත්තේය.

සවුත් ඒෂියා පාර්ට්න(ර්)ෂිප් ආයතනයේ මඟපෙන්වීම හා උපදෙස් යටතේ සමිතියෙන් ලබාගත් ව්‍යාපාර කළමණාකරනය, පොත් තැබීම ආදි දැනුවත් වීම් හා පුහුණුව වෙළඳ ව්‍යාපාර විධිමත්ව සිදුකරගෙන යාමට ඉමහත් පිටුවහලක් වූ බව සඳහන් කරයි. යතුරු පැදියක්, ත්‍රීරෝද රථයක් පවා මිලදී ගෙන ගෙදර වැඩිදියුණු කරගැනීමට පවා ඉවහල් වූ බව කියයි.

සමිතියේ සාමාජිකාවන් කිහිපදෙනෙකුට ස්වයං රැකියා අවස්ථා උදාකරමින් උදේ හා සවස කෙටි ආහාර නිපදවා ඇයගේ වෙළඳ සැලේ තබා අලෙවි කිරීමේ ක්‍රමවේදයක් සකස්කර දී ඇත.

2021 වර්ෂයේ දී වෙළඳ ව්‍යාපාර වැඩි දියුණු කරගැනීම පිණිස රු. 50000/- ක ණය මුදලක් සමිතියේ මූලිකත්වයෙන් සැප්ශ්‍රී ආයතනයෙන් ඇය වෙත ලබා දෙන ලදී. එකී මුදලින් ලබාගත් භාණ්ඩ ප්‍රමාණය අද වන විට ඉතාම ප්‍රයෝජනවත් වූයේ පවතින COVID 19 වසංගතය නිසාවෙන් විටින් විට පවතින සෞඛ්‍යාමය නීති හා සංචරණ සීමා පැනවීමේ දී පාරිභෝගික අවශ්‍යතා සඳහා භාණ්ඩ විකිනීම සඳහා සැලකිය යුතු ප්‍රමාණයක් ගබඩා කර තබාගැනීමට හැකිවීමයි.





## '' දිවියට අරුතක් ''

දරුවන් සිව්දෙනෙකුගේ මවක් ලෙස තම ස්වාමියා මිය යාමෙන් පසු පවුලේ බර තනිවම කරට ගැනීමට සිදු වූ ඇය අනේක විධ ආර්ථික අපහසුතා හමුවේ අසරණ වූ අවස්ථා බොහෝ විය.

මහනුවර හතර ලියද්ද ප්‍රදේශයේ උපන් ඇය නමින් බණ්ඩාර මැණිකා නම් විය. පාසල් අධ්‍යාපනයෙන් පසු විවාහ දිවිය ආරම්භ කරනුයේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ තිරප්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පෙරියකුලම ග්‍රාමයේ පදිංචි ආර්. කපුරු බණ්ඩා සමගය. වෘත්තියෙන් ගොවියෙකු වූ ඔහු සැලකිය යුතු ඉඩම් හිමියෙකුද නොවූ අතර ප්‍රධාන වශයෙන් කුලී වැඩ කරමින් දවසේ දිවිය සරි කර ගන්නා ලදී. දරුවන් හතර දෙනෙකු සහ තම බිරිඳ සමඟ ඉතා දුක්කිත දිවියක් ගෙන යන ලදී.

මේ අවදියේ ඇති වූ හදිසි අසනීප තත්ත්වයක් හේතුවෙන් තම ස්වාමිපුරුෂයා රෝගාතුරව හදිසියේම මිය යන ලදී. තම උර මත මහමෙරක් තරම් වූ බර කරට ගත් ඩිංගිරි මැනිකා හිත හයිය කර ගත්තාය. කෙසේ හෝ තම දරුවන්ට උගන්වා උස් මහත් කර ගැනීමට ඇය දැඩි අධිෂ්ඨාන කර ගන්නා ලදී.

මේ කාලයේ තම ලොකු දුව විවාහ වෙයි. පසුව තම එකම පුතු අධ්‍යාපනය නතර කරයි. මවගේ සහායට ඔහුද ඇයට සහය වන්නේය. මේ අතර තුර 2014 වර්ෂයේ ඇය සැප් ශ්‍රී රන්මුතු ග්‍රාමීය සංවිධානයේ සාමාජිකත්වය ලබා ගනියි. කෙසේ නමුත් මුල් අදියරේදී ඇයට ණයක් දීමටවත් ඇයට හැකියාවක් නොලබයි. ඒ අනුව 2014 වර්ෂයේ සිට සංවිධානයේ අරමුදලින් සුළු වශයෙන් ණය ලබාගෙන පවුලේ අවශ්‍යතා ඉටු කර ගන්නා ලදී. පසුව 2015 වර්ෂයේ 20,000.00 ක ණය මුදලක් ලබා ගන්නා ලදී. එහිදී එය උපයෝගී කරගෙන ගොවිතැන් කටයුතු ආරම්භ කරන ලදී. ඒ අනුව නැවත 2018 වර්ෂයේ සැප් ආයතනයය මගින් රු. 20,000.00 ක ණය මුදලක් ලබා ගන්නා ලදී. එහිදී තම පුතාගේ වෘත්තියට උදව්වක් වශයෙන් වඩු උපකරණ මිලදී ගැනීමට (ලී කපන යන්ත්‍රය) එම මුදල යොදා ගන්නා ලදී.

මේ අතර තුර තම බාල නිවුන් දරුවන් දෙදෙනා උසස් පෙළ ලියමින් සිටී. ඔවුන් දෙදෙනා පෞද්ගලික පන්ති සඳහා සහභාගි කර වීම අත්‍යවශ්‍ය විය. කෙසේ වෙතත් දිවියේ බර සමඟ දෙදෙනාටම වියදම් කිරීම ඉතා දුෂ්කර විය.ඒ අනුව එක් අයෙක් එක් දිනක් පන්ති ගොස් අනෙකා එම සටහන් බලා පාඩම් කළාය. එහි අග්‍ර ප්‍රතිඵලය වූයේ එක් දුවක් පේරාදෙණිය විශ්ව විද්‍යාලයට තේරී පත්වීම සහ අනෙක් දියණිය රජරට විශ්ව විද්‍යාලයට තේරී පත්වීමය.

ඇයගේ කැප කිරීමට මහඟු පිටුවහලක් විය. විවිධ අවස්ථා වලදී ග්‍රාමීය සංවිධානයෙන් හා සැප් ශ්‍රී ආයතනයෙන් ලබාගත ණය උපයෝගී කරගෙන ඇයට මේ දිවි ගමන සාර්ථක කර ගැනීමට හැකි විය.

ඇයගේ කැප කිරීමට මහඟු පිටුවහලක් විය. විවිධ අවස්ථා වලදී ග්‍රාමීය සංවිධානයෙන් හා සැප් ශ්‍රී ආයතනයෙන් ලබාගත ණය උපයෝගී කරගෙන ඇයට මේ දිවි ගමන සාර්ථක කර ගැනීමට හැකි විය.

තවද 2021 වර්ෂයේ ඇය රු. 200,000/=ක ණය මුදල් සැප් ශ්‍රී ආයතනයෙන් ලබාගෙන නළ ළිඳක් සවිකරගෙන 365 දවසෙම ගෙවත්ත උපයෝගි කරගෙන එළවළු වගා කරගෙන යනු ලබයි. දැන් ඇය කාගෙවත් කුලී වැඩය නොයයි. තම ගෙවත්තේ වගා කර ගනිමින් වැඩි ආදායම් ලබා ගනී. කාලය ඉතුරු කරගෙන ඇත. දැන් ඇයට ආර්ථිකය සරුය. දරුවන් දෙදෙනාද විශ්ව විද්‍යාල උපාධිය හදාරා රැකියා වල යෙදී ඇත. ඇයගේ දිවිය සරු කිරීමට අපට උදව් කිරීමට හැකි වීම සැප් ශ්‍රී ආයතනය ලද භාග්‍ය වේ. ඇය නිරන්තර ඒ සඳහා පිං ලබා දෙයි.







# වසර තිහක ඉතුරුම් පිළිබඳ දිගු ගමනක කතන්දරය : රුපියල් පහේ විප්ලවය

ජනරුකුල සංවිධානයේ නිර්මතෘ උපාලි සුමිත්‍ර මහතා විසින් විසින් මෙහෙය වූ 1983 සිට මේ දක්වා පැවතෙන කාන්තා සවිබලකරණ ව්‍යාපරයක් මූලික කරගෙන “රුපියල් පහේ විප්ලවය” නම් මෙම කෘතිය රචනා කිරීමට සිඩ්නි මාක්ස්ට වස්තුබීජය සැකසෙන ලදී. **රුපියල් පහේ විප්ලවය කෘතිය ජනරුකුල සංවිධානයේ ප්‍රකාශනයක් වන අතර නොවැම්බර් මස 27 වන දින පදනම් ආයතනයේ දී එය එළි දක්වන ලදී. එම අවස්ථාවට රුහුණු විශ්වවිද්‍යාලයේ සමාජවිද්‍යා මහාචාර්ය උපාලි පන්නිල, සමෘද්ධි , ක්ෂුද්‍ර මූල්‍ය , ගෘහ ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම් හේමා පෙරේරා,ජාතික සමාජ සංවර්ධන ආයතනයේ වැඩ බලන අධ්‍යක්ෂක ජනරාල් ෂාමිණී අත්තනායක, ශ්‍රී ලංකා සමූපකාර මණ්ඩලයේ උපදේශක ඒ.බී බුලත්ගම මහතා සහ පාරිභොගික කටයුතු රාජ්‍ය අමාත්‍ය ලසන්ත අලගියවන්න, කෘතිය රචනා කළ සිඩ්නි මාක්ස් යන මහත්ම මහත්මීන් සහභාගි විය. ඒ සදහා කොළඹ, ගම්පහ, කුරුණෑගල, මහනුවර සහ ආණමඩුව ප්‍රධාන කොටගෙන ඇති කාන්තා සමිති නියෝජනය කරමින් කාන්තාවෝ විශාල ප්‍රමාණයක් සහභාගී වූහ. ඊට අමතරව විකල්ප සංවර්ධන කේෂ්ත්‍රයේ වැඩකරන පාර්ශවකරුවන්ද සහභාගි විය. රුපියල් පහේ විප්ලවය යනු පුංචි දෙයකින් සිදුකළ හැකි විශාල ප්‍රගතිය පිළිබද කතන්දරයක් විය. ඉතුරුම් වල ප්‍රගතිය පිළිබද සැබෑ විප්ලවයක්ම විය.**

ජනරුකුල සංවිධානයේ දශක තුනක් තිස්සේ සිදුකෙරුණු ආන්තීකරණයට ලක් වූ කාන්තාවන් ඉලක්ක කරගත් සමාජ බලසතුකරණ ව්‍යාපෘතියේ අඛණ්ඩ සහ දිගුකාලීන

උත්සාහයක් යථාර්ථයක් බවට පත්කර ගැනීමේ මහගු අවස්ථාවක් ලෙස මෙම කෘතිය සමාජගත කිරීම හැදින්විය හැකිය. සිඩ්නි මාක්ස් "රුපියල් පහේ විප්ලවය රචනය ආරම්භ කිරීමට පටන් ගන්නේම එම ව්‍යාපෘතිය පිළිබඳව අවුරුද්දක පමණ ක්ෂේත්‍ර පර්යේෂනයක ප්‍රතිඵලයකිනි. මෙම ව්‍යාපෘතියට සම්බන්ධ වූ ප්‍රධාන දත්ත දායකයින්ගෙන්ද, සියලු කාන්තා සංවිධාන නියෝජිතයින්, සාමජිකයින් සහ සම්බන්ධ පාර්ශවකරුවන් සමග ගැඹුරු සම්මුඛ සාකච්ජා සහ ඉලක්කගත සම්මුඛ සාකච්ජා වලින් ලබාගත් පසුවිපරමක් පදනම් කරගත් පර්යේෂනයක ප්‍රතිඵලයක් ලෙසයි. ඒ නිසා සිඩ්නි මාක්ස් මෙම කෘතිය රචනා කිරීමේ දී නිහඬ සාක්ෂිකරුවෙක් ලෙසත් තෙවන පර්ශවකරුවෙක් ලෙසත් සුවිශේෂ කාර්යභාරයක් සිදුකර ඇති බව කෘතිය පරිශීලනය කිරීමේ දී පාඨකයාට දැනේ.

කෘතියේ අන්තර්ගතය පිළිබඳ සරලව දැක්වුවහොත්, ජනරුකුල ආයතනය දශක තුනක් තිස්සේ සිදුකර ඇති විප්ලවීය ගමන් මග සැකවේින් විස්තර කිරීම හදුනාගත හැකියි. මෙම අත්දැකීම, දිළිදුබවේ දුෂ්ඨ චක්‍රයට හසුවූ, යැපුම් මානසිකත්වයට යොමු වූ, රටේ සංවර්ධනයට දායක නොවූ, ආන්තීකරණයට ලක් වූ ජනකොටස් සවිබලකරණය සදහා විකල්ප සංවර්ධනය පිළිබඳ විශ්වාසයක් තිබෙන අපට තවදුරටත් එ සදහා සිසුන් සහ සමාජ වැඩ වෘත්තිකයින් මෙහෙයවීම සදහා ද ප්‍රබල උත්ප්‍රේරකයක් සපයනු ලබයි.

කෘතියේ අන්තර්ගතය එකිනෙකට ගත්විට රුපියල් පහේ විප්ලවයට සම්බන්ධ ආකර්ශනීය තේමාවන්ගෙන් ග්‍රහණය. ඒ අතර, දුර්වල මිනිස් බවට එල්ල වූ දුගී බවේ අභියෝගය, රුපියල් පහේ සමාජ බලසතුකරණ සුත්‍රය , මුලදී ගමන හරි දුෂ්කරයි, ඒත් දැන් දැනෙන සතුට වගේය , ආපු දුරත් හිතා ගන්නත් බැරි තරම්, ඉබි ගමනින් ආව දුර ගමන, කන්ද උඩරට කාන්තාවන් ජීවිත කන්ද තරණය කළ හැකි, රුපියල් පහේ විප්ලවය, අපිත් ජයගත්තා සමූපකාර

සංකල්පය , ජනතාව බලසතුකිරීමට රුකුලක් කරගත් හැටි, දුගී බවට අභියෝග කළ දුර්ලභ මිනිස්කම සමාජ බලසතුකරණය සඳහා කුඩා කණ්ඩායම් ක්‍රමවේදය ක්‍රියාවට නැගු තවත් අය, ගමන දුරයි ඒත් හෙට එච්චර කළුවර නෑ යන ප්‍රධාන මාතෘකා ඔස්සේ විහිදුණු විකල්ප සංවර්ධනය සඳහා අත් පොතක් ලෙස යොදා ගත හැකි අනගි කෘතියක් ලෙස දැක්විය හැකිය. සංවර්ධනය යනු බහුමානික සංකල්පයක් වන අතර එය එක රැයකින් ලගා කරගත හැකි දෙයක් නොවේ. සංවර්ධන ක්‍රියාවලිය ලගා කර ගැනීම සඳහා පළමු පියවරක් තබන්නේ කෙසේද යන්න විකල්ප සංවර්ධන ප්‍රවේශය ඔස්සේ සැබෑ සාක්ෂි පදනම් කරගෙන කෘතිය නිර්මාණය කර ඇත.

සමාජ වැඩ වෘතිකයින් වශයෙන් අපගේ විෂය පථය සකස් වී ඇත්තේ ද පුද්ගලයාට සහ පවුලට, කණ්ඩායම් වලට සහ ප්‍රජාවට ඔවුන් මුහුණ දෙන ගැටලු සඳහා සෘජුව සහ වක්‍රව මැදිහත්වීමටයි. සමාජ වැඩ යනු පුහුණු වෘත්තියකි. ඒ තුළින් අවාසිදායක කණ්ඩායම් මුහුණ දෙන සමාජ, ආර්ථික, දේශපාලන මෙන්ම පුද්ගලිකව මුහුණ දෙන ගැටලු සඳහා විද්‍යාත්මකව මැදිහත්වීමත් සවිබලකරණය සිදුකරනු ලබයි. ඒ සඳහා සමාජ සාධාරණත්වය සහ සමානාත්මතාවය මෙන්ම මානව හිමිකම් වැනි ප්‍රජාතන්ත්‍රවාදී ඇගයුම් මූලික කරගෙන එම ප්‍රජාවන් නිදහස් නිවහල් පුද්ගලයින් බවට පත්කිරීමත් සිදුකරනු ලබයි.

රුපියල් පහේ විප්ලවය මෙහෙය වූ උපාලි සුමිත්‍ර ඇතුළු ජනරුකුල සංවිධානයත් එම කාන්තාවනුත් වෘත්තීය සමාජ වැඩ නොදෙන වෘත්තීය සමාජ වැඩ භාවිතය සහ මැදිහත්වීමට ප්‍රබල සාක්ෂි කෘතිය පුරා සපයනු ලබයි. රුපියල් පහෙන් ඉතුරුම් ආරම්භ කර පවතින සමාජ ආර්ථික දේශපාලන ක්‍රමය තුළ කාන්තාවන් සවිබලකරණය යනු පහසු විප්ලවයක් නොවේ. එ සඳහා දිගුකාලීන සැලසුම් අවශ්‍ය වේ. ඒ සඳහා, ප්‍රජා වැඩ විධික්‍රමය යොදා ගැනිමින්,

කණ්ඩායම් වැඩ ක්‍රමවේදය යොදා ගනිමින් පහසුවෙන් ආන්තිකරණයට ලක්වූ කාන්තාවන් කණ්ඩායම් බලමුළුගැන්වීමේ සිට ප්‍රජා සවිබලකරණ න්‍යායාන් උපයෝගි කරගෙන ප්‍රායෝගික තලයට ගෙන ඒමට කදිම නිදසුනක් ලෙස රුපියල් පහේ විප්ලවය හැදින්විය හැකිය. විශේෂයෙන්ම අවාසිදායක කණ්ඩායම් මුහුණ දෙන සැබෑ ගැටලු හදුනා ගැනීම, එම අවශ්‍යතාවය ඔවුන් තුළින්ම පැන නැගීම , ඒ සදහා බලමුළු ගැන්වීම, ප්‍රජාව සංවිධානගතකිරීම, ක්‍රියාත්මක කිරීම සහ පසුවිපරම ආදිය සමාජ වැඩ වෘත්තිය මැදිහත්වීම හා සන්සන්දනාත්මක රුපියල් පහේ විප්ලවය හදුනාගත හැකිය. එසේ විග්‍රහ කරගත හැකි තිරසාර මැදිහත්වීමක් කෘතියේ අඩංගු වේ.

සමාජ වැඩ වලදී අප කතා කරන සමාජය තුළ තිබෙන බලසම්බන්ධතාවය සමග ගැටගැසුණු අසමානකාරී පීඩාකාරී ව්‍යුහය වෙනස් කිරීම සදහා ආර්ථික සහ සමාජීය බලගැන්වීම සිදුකරන ආකාරයට උදාහරණ සපයනු ලබයි. රුපියල් පහේ විප්ලවය මගින් සමාජයට ගෙන යන පණිවිඩය කුමක්ද? දුප්පතෙක් වී ඉපදුණු අපි දුප්පතෙක් වී මිය යා යුතුද? දුප්පතෙක් වී ඉපදීම ජීවිතය ජයගැනීමට අභියෝගයක්. නමුත් එයද දුර්ලභ මිනිස්බව නිසාම වෙනස් කළ හැකියි. දුප්පත්කමේ කේන්ද්‍රීය ලක්ෂණයක් ලෙස අප හදුනා ගන්නා පරාධීනත්වය පරදා දුගීබවයේ ගිලුණු ලක්ෂ ගණනක් ජනතාව මිනිස්බවේ පරිපුර්ණත්වය ලබා ගැනීමේ අවස්ථාව හිමිකර දීම පිළිබද හිතට මෙන්ම ප්‍රජානනයටත් දැනෙන පාඩම් කෘතිය තුළ අන්තර්ගත වේ. දුප්පත්කම යනු සමාජීය නිර්මිතයකි. එය වෙනස් කිරීමේ විසදුම් ද මෙම නිර්මිතය තුළින්ම සොයාගත හැකියි.

නිදහසින් පසු වසර 73ක කාලයක් තිස්සේ අපිට නිරීක්ෂණය වූයේ සංවර්ධනය යනු අධිපති දෙයක් ලෙසයි. බලය හොබවන පාර්ශව විසින් පීඩිත ජනයාගේ සංවර්ධනය තීරණය කිරීම

අපිට පුරුදු අත්දැකීම වේ. දුප්පතුන් ඇතුළු ආන්තික කණ්ඩායම් සංවර්ධනය සඳහා සැබැවින්ම යොදා ගනු ලබනවාද යන්නත් දිගින් දිගටම මතුවූ ලෙහා ගත නොහැකි ගැටලුවකි. වර්තමානයේ ද සිදුව ඇත්තේ රාජ්‍ය සහ වෙළඳපොළ බලවේග අනුව, එක සමාජ පංතියක පැවැත්ම උදෙසා මාරුවෙන් මාරුවට සංවර්ධනය තීරණය වීමයි. කොරෝනා ධනවාදය මගින් සපත කලේ ද එකී දහමයි. ඔවුන්ගේ ධනසම්මුච්තකර ගැනීම දෙස සුසුම් හෙළීම නුපුරුදු දෙයක් නොවේ . සිදුවිය යුත්තේ විමුක්තියේ මාර්ගය සොයා ගැනීමයි. එය සහභාගීත්ව සංවර්ධනයට ප්‍රබල අභියෝගයකි. එම දාමය වෙනස් කිරීමට නම් බිම්මට්ටමේ සිට ප්‍රශ්න කරන පුරවැසියන් බිහිකිරීමේ වගකීම මෙම ක්‍රියාවලීන්ට දායකවන පුරවැසියන්ට තිබේ.

රාජ්‍ය සහ බොහෝ රජයන්ට සේම රාජ්‍ය නොවන සංවිධානවලට දුප්පත්කම යනු ව්‍යාපෘතියකි. විශාල පිරිවැයක් දරා සිදුකරන අල්ලක වැඩ අපි ඕනෑතරම් දැක ඇත. එවැනි තාවකාලික පැලැස්තර වෙනුවට දුප්පතුන්ගේ සැබෑ ගැටලු වලට ආමන්ත්‍රණය කිරීම බොහෝ ව්‍යාපෘති වලින් ගිලිහේ. නමුත් සාර්ථක ප්‍රතිඵල ලබාගත් සණස, හම්බන්තොට කාන්තා සංවිධානය මෙන්ම අප්‍රසිද්ධියේ වැඩකරන මතුනොවුණු ව්‍යාපෘති රට තුළ දක්නට ඇත. ඒවාට අවශ්‍ය මැදිහත්වීම සහ ප්‍රසිද්ධිය ලබාදීම අප විසින් අනිවාර්යෙන්ම සිදුකළ යුත්තකි. මේ ලියවිල්ල සැකස්වෙන්නේම එම අරමුණ පෙරදැරි කරගෙනයි.

ගඩොල් කපා ජීවිකාව කරගත් මෙම කාන්තාවන් තම ගෙදරට අවශ්‍ය ආහාර ලබාගන්නේ ද ගමේ මුදලාලිගෙන් වන අතර ගඩොල් නිෂ්පාදන ලබාදෙන්නේද ඔහුටමයි. මෙම හුවමාරු මාධ්‍යය නිසා අවසානයේ කාන්තාවන්ට කිසිම මුදලක් ඉතුරු නොවේ. මේ චක්‍රය බිඳදැමීම සඳහා ජනරුකුල සංවිධානයේ නිර්මාතෘ උපාලි සුමිත්‍ර, පාවුලෝ ෆේයර්ගේ පීඩිත

අධ්‍යාපනවේදය යොදාගනිමින් මූලාමය සාක්ෂරතාවය සහ සවිඥාණිකත්වය ඇති කිරීම ගනු ලැබූ උත්සාහය ප්‍රශංසනීය වේ. පීඩකයා සහ පීඩිතයා අමානුෂික බවට පත්කිරීම වෙනුවට පීඩිතයා සහ පීඩකයා යන දෙදෙනාම පීඩාකාරී සමාජ ව්‍යුහය තුළ මානුෂීය බවට පත්කිරීම පිළිබඳ ආදර්ශ කෘතියෙන් සපයනු ලැබේ. ගඩොල් මුදලාලීගේ චරිතය ඒ සඳහා කදිම උදාහරණයකි. අපිට පුරුදු ධනපතියා විනාශ කිරීමයි. නමුත් මෙහි අන්තර්ගත වී තිබෙන්නේ ධනපතියාත් එක්ව යන ගමනක් පිළිබඳවයි.

සාධාරණත්වය සහ සමානාත්මතා මූලධර්ම අනුගමනය කරමින් අසාධාරණ බලව්‍යුහය වෙනස් කිරීමට ප්‍රශ්න නැගීම , විචාරශීලී සවිඥාණික කණ්ඩායම් ගොඩනැගීම, යැපුම් මානසිකත්වය වෙනුවට තමන්ගේ ගැටලුවලට තමන් තුළින් විසඳුම් සොයා ගැනීමට මැදිහත්වීමට අදාළ ප්‍රත්‍යෙක කෘතිය පුරා සපයනු ලැබේ. රූපියල් පහේ බලසතු කරණ සූත්‍රය තුළින් සිංහල කාන්තාවන් පමණක් නොව දමිළ සහ මුස්ලිම් කාන්තාවන් ද සවිබලකරණය දැක්විය හැකිය. සහභාගීත්ව සංවර්ධන සඳහා අන්තර්කරණ සංවර්ධන ආකෘතිය (Inclusive Development Model) කෘතිය පරිශීලනය කිරීමේ දී මා සිතගත් ප්‍රබල කරුණක් විය. මෙම ව්‍යාපෘතිය මගින් ජනවාර්ගික විවිධත්වයට ආමන්ත්‍රණය කිරීමත් සුළුතරය නියෝජනය කරන කාන්තාවන් සවිබලකරණයත් සුවිශේෂ වේ. සාධාරණ සහ සමානාත්මතාව මූලධර්ම යොදා ගැනීම පිළිබඳ එය ප්‍රබල සාක්ෂියක් වේ. සංවර්ධනය යනු සමස්ත ජනකොටස් නියෝජනයවීමක් මිස හුදු එක් කණ්ඩායමක් පමණක් රැගෙන යන ගමනක් නොවේ.

දුප්පත්කමේ අභියෝගය එම කණ්ඩායම් සමග එකතුව විපර්යකාරක භූමිකාව පණ පොවන්නේ කෙසේ ද යන්න කෘතියේ ආරම්භයේ සිටම අවසානය දක්වාම ගෙනහැර දක්වනු ලබයි. ඒ සඳහා ක්‍රමානුකූල මැදිහත්වන්නේ කෙසේද යන්න සමාජ වැඩ විෂය ඉගෙන

ගන්නා දුහුනන්ට ප්‍රජා වැඩ විධික්‍රමය ප්‍රායෝගිකව ක්‍රියාවට නංවන්නේ කෙසේද යන්නට කදිම සාක්ෂියක් ලෙස දක්වන මෙම කෘතිය පරිශීලනය කිරීමට යෝජනා කරමි.

සාක්ෂි මත පදනමප්‍රතිලාභීන්ගේ ප්‍රවේශයෙන්ම ස්වයං සංවර්ධනය ලගාකර ගත හැකි ආකාරය පිළිබඳව කෘතියේ සාරගර්භ බව තවදුරටත් තීව්‍ර කරනු ලබයි. විගණනය, ආර්ථික විගණනය පමණක් නොව සමාජ විගණනය ද පිළිබඳ පූර්වාදර්ශ මෙම කෘතිය පුරා දක්නට ලැබේ. දශක තිහක් තිස්සේ සිදුකළ විපර්යකාරක වැඩසටහනක ප්‍රගිතිශීලි ප්‍රයත්නය පිළිබඳවත්, සක්‍රීය පුරවැසියන් සංවර්ධන ක්‍රියාවලියේ දී තීරණ ගැනීමේ ක්‍රියාවලියට සම්බන්ධ කරවීමේ අවශ්‍යතාවයත්, නිරෝගි ප්‍රජාතන්ත්‍රවාදය ගොඩනගා ගත හැක්කේ කෙසේද යන්නට ඉගි කෘතිය පුරාම සපයනු ලැබේ.

විකල්ප සංවර්ධනය අත්හදා බලන, සහභාගීත්ව සංවර්ධන ක්ෂේත්‍රයේ නියෙලෙන සමාජ වැඩ වෘත්තිකයින්ට, සජීවිකාරකවරුවන්ට සහ විපර්යකාරකවරුන්ට උත්ප්‍රේරකයන් වෙමින් විකල්ප සංවර්ධන ප්‍රවේශයන්ට අවතීර්ණ වීමට අවශ්‍ය ආරම්භක ශක්තිය මනා පසුබිමක් මෙම කෘතිය මගින් සපයනු ලැබේ. විශේෂයෙන් දැනුම, කුසලතා සහ ආකල්ප සංවර්ධනය යන මූලික කුළුණු තුන ප්‍රධාන කොටගෙන සාක්ෂි පදනම් කරගත් ප්‍රවේශයකින් යොදා ගනිමින් විකල්ප සංවර්ධනය ප්‍රවේශයන් ලගාකර ගතහැකි ආකාරය සාකච්ජා කරනු ලබයි.

ප්‍රායෝගික ක්‍රම භාවිතාකරමින්, දේශීය ඥාණය උපයෝගී කරගෙන සිදුකරන මෙම විවිධ ප්‍රදේශ වල කාන්තාවන් සවිබලකරණය කිරීමේ දී අනුගමනය කළ හැකි ඇගයුම් පදනම් කරගත් ප්‍රවේශයක් සඳහා ඉගි මෙම කෘතිය මගින් සපයනු ලැබේ. වර්තමානයේ ක්ෂුද්‍ර මූල ණය පිළිබඳ විශාල අර්බුදයක ශ්‍රී ලංකාවේ ග්‍රාමීය කාන්තාවන් ගිලී සිටින මෙහොතක,

ජනරුකුල සංවිධානයේ කුඩා කණ්ඩායම් මූලික කරගෙන සිදුකරන ඉතිරිකිරීම් සඳහා මානවවාදී ප්‍රවේශයකින් අස්වැන්න ලගාකර ගැනීමේ කතාව ද මෙහි අන්තර්ගත වේ. ඒ සඳහා ඉවසීමෙන් සහ කැපවීමෙන් දිගුකලක් තිස්සේ වැඩකිරීම පිළිබඳ ගැඹුරු පාඩම් මෙම මැදිහත්වීමේ දී හඳුනගත හැකිය. වර්තමානයේ ක්ෂුද්‍ර මූල ණය, මූලික කරගෙන සිදුකරන කාන්තා සවිබලකරණය වැඩසටහන්වල අපේක්ෂිත ප්‍රතිඵල ලගා කර ගැනීමට නොහැකි වී තිබෙන්නේ ඉතිරිකිරීම් සහ නිවැරදි ආයෝජනය සඳහා අවශ්‍ය මූල්‍ය විනය සහ මූල්‍ය සාක්ෂරතාවය නොතිබීම හේතු ලෙස දැක්විය හැකියි. විශේෂයෙන් නව ලිබරල්වාදී ආර්ථිකය තුළ ක්ෂණික විසඳුම් සෙවීම සහ අවසානයේ දී තවදුරටත් යැපෙන්නන් බවට පත්වීම සහ ණය උගුල සිරවීම දක්නට ලැබීම පිළිබඳ තර්කයෙන් මා මතුකරන්නේ ක්ෂුද්‍රමූල්‍ය ආයතන සුදු හුනු ගෑම නොවේ. ණය පිළිබඳව වගකීම පිළිබඳව මතක් කිරීමටයි. විකල්ප සංවර්ධනය මුවවෙන් සිදුකරන ක්ෂණික මෙන්ම පීඩාකාරී ක්ෂුද්‍රමූල්‍ය ආයතනවල මැදිහත්වීම්ට මෙවැනි ව්‍යාපෘතිය ප්‍රබල කනේ පහරක් ලෙස දැක්විය හැකිය.

ආන්තීකරණ ප්‍රජාවන් ලෙස කාන්තාවන් ස්වශක්තියෙන් නැගී සිටීම අවශ්‍ය ස්වයං ඥාණය, මූල්‍යමය විනය, ණය පිළිබඳව ඇති වගකීම, කණ්ඩායමේ සාමාජිකයින් අතර අඛණ්ඩ ඉතිරිකිරීමේ පුරුද්ද, විශ්වාසවන්ත ලෙස කටයුතු කිරීම, කණ්ඩායම් ජීවිතය සහ සම්බන්ධතා වර්ධනය, සාමූහික තීරණ ගැනීමේ ක්‍රියාවලිය, කණ්ඩායමේ අනෙක් සාමාජිකයින් කෙරෙහි ඇති වගකීම, අන් අයගේ දියුණුව සඳහා සාමූහික මැදිහත්වීම කැපවීම, විනිවිදභාවය, බලය කේන්ද්‍ර කරගැනීම වෙනුවට බලය විමධ්‍යගත කිරීම, ඉදිරිගාමී නායකත්වය ආදී මූලධර්ම මගින් කාන්තාවන්ගේ ජීවන පරාසයන් පුළුල් වීම සඳහා සජීවි අත්දැකීම් මෙම කෘතිය මගින් සපයනු ලැබේ.

ග්‍රාමීය කාන්තාවන්ගේ දිළිඳුකම තුරන් කිරීම සඳහා වැදගත් වන ආර්ථිකය ශක්තිමත් කිරීමට ප්‍රමුඛත්වයක් ලබාදෙන ගමන් එම ආර්ථික ශක්තිමත්භාවය තිරසාරව රදාපවත්වාගෙන යාමට අවශ්‍ය බුද්ධිමය විභවතාවයන් ද මෙම ජනරුකූල ඉතිරිකිරීමේ වැඩසටහන මගින් ලබාදේ. ඊට අමතරව නිධන්ගත ව්‍යාධියක් බවට පත්වී ඇති සමාජීය සහ ආධ්‍යාත්මික දුගීබවේ සංස්කෘතිය කඩාබිඳ දැමීට අවශ්‍ය රෝග නිධානය ස්වයං විශ්ලේෂණයකින් සහ කණ්ඩායම් මැදිහත්වීමකින් සහ සාමූහික ප්‍රයත්නයකින් සිදුකළ හැකි ආකාරය සඳහා කිදිම නිදර්ශන පොත පරිශීලනයේ දී හඳුනා ගැනීමට හැකිය. අත්දැකීම් පදනම් කරගත් දැනුමක්, මිනිස් ජීවිත සමග ගණුදෙණු කරන ප්‍රතිලාභීන්ට වගනොකියන, මූල්‍යමය අරමුණු මුවාවෙන් වංචනික ලෙස සංවර්ධන ක්ෂේත්‍රයේ නියළී සිටින නූතන ක්ෂුද්‍රමූල ණය අර්බුදයේ නිර්මාතෘවරුන්ට මෙන්ම ඔවුන්ගේ නියෝජිතයන්ට ද තිරසාර විසඳුම් සොයා ගැනීම සඳහා පර්යේෂණ මෙවලමක් ලෙස මෙම කෘතිය දැක්විය හැකිය. විශේෂයෙන්ම ඉතිරිකිරීමේ මානසිකත්වය සහ යැපුම් මානසිකත්වය තුරන් කිරීමට අවශ්‍ය දක්ෂතාව පදනම් කරගෙන යන නිර්මාණශීලී ප්‍රවේශයන් යොදා ගනිමින් නිවරදි මූල්‍ය සේවා උපදේශකත්වය ලබා දී ඇති වැඩසටහනක් ලෙසද හුවා දැක්විය හැකියි.

දශක දෙකහමාරක කාලයක් කුඩා කණ්ඩායම් ක්‍රමවේදය සහ සමූපකාර ක්‍රමයේ සාධනීය පැතිකඩ අනුගමනය කරමින් සිදුකිරීම අරමුණු සහගත සංවර්ධනයකට සුසුමාදර්ශ මාරුවක් ලෙස දැක්විය හැකියි. අවසාන වශයෙන් දැක්විය හැක්කේ, සාකල්‍යවාදී ප්‍රවේශයක් අනුගමනය කරමින් ආන්තීකරණයට ලක්වූ කාන්තාවන් සක්‍රීය මෙන්ම වඩා පරිණත පුද්ගලයින් බවට පත්කිරීම සඳහා සමාජ පරිවර්තනයක් සඳහා සිදුකරන රුපියල් පහේ

විප්ලවය මගින් ආන්තිකරණයට ලක්වූ කාන්තාවන් සවිබලකරණය සඳහා සැබෑ ජනතා විප්ලවයක් සඳහා මෙවලමක් ලෙස මෙම කෘතිය නිර්දේශ කළ හැකිය.

ඊට අමතරව උපාලි සුමිත්‍රගේ මැදිහත්වීම් සමාජ වැඩ වෘත්තීයවේදියකුගේ භූමිකාව මැනවින් විශද වේ. ප්‍රජාතන්ත්‍රවාදී නායකයකත්වය, සංවිධානාත්මක බව, තිරසාර සැලසුම්, සම්පත් සම්බන්ධීකරණය, ව්‍යවසායකත්වය, කළමණාකරණය, උපදේශකයෙකු ලෙස කටයුතු කිරීම, අධ්‍යාපනඥයෙකු ලෙස කටයුතු කිරීමත්, පහසුකාරකයෙකු ලෙස කටයුතු කිරීමත් කෘතිය පරිශීලනයේ දී මැනවින් විශද වේ. ඊට අමතරව ඔහුට පියාගෙන් ලැබූ පන්නරය මෙන්ම මිතුරු ඇසුර නිර්මාණශීලීත්වය ජාත්‍යන්තර අත්දැකීම දැනුමෙන් යාවත්කාලීනවීම, ඉවසීම, තමා වැඩ කරන ප්‍රජාව වෙනුවෙන් පෙනී සිටීම ,බොරු පොරොන්දු නොදීම, වැනි ගුණාංග පිළිබඳවත් පූර්වාදර්ශ සපයනු ලැබේ.

මෙම කෘතිය විවරණය කිරීමේ දී වෘත්තීය සමාජ වැඩ මැදිහත්වීම් හඳුනාගත හැකි විද්‍යාත්මක භාවිතයෙන් පොහොසත් කෘතියක් ලෙස අවසාන වශයෙන් ද දැක්විය හැකිය.

සමස්ත කෘතිය පිළිබඳ දැක්වීමේ දී සිඩ්නි මාක්ස් විසින් මෙම කෘතිය පර්යේෂණාත්මක ග්‍රන්ථයක් ලෙස රචනා කළ ද ජනරුකුලේ සමස්ත මැදිහත්වීම මැනවින් ඉදිරිපත් කර ඇත. මේ පොත එළි දක්වන උත්සව අවස්ථාවට සම්බන්ධ වීමට අවස්ථාව ලැබීම නිසාත් ව්‍යාපෘතියට සම්බන්ධ වූ කාන්තාවන්ගේ කතන්දර තවදුරටත් කෘතියේ සාකච්ඡා කරන කරුණුවලට ප්‍රබල ආලෝකයක් සපයනු ලැබීය. සමාජයේ යහපත් වෙනසක් ඇති කිරීමට සැබැවින්ම බිම්මට්ටමේ සිට වෙහෙසන උපාලි සුමිත්‍ර වැනි පිරිස් ඕනෑ තරම් සිටියි. ඔවුන් ඇගයීම, දිරි ගැන්වීම ඔවුන්ට අවශ්‍ය ශක්තිය ලබා දීමට අපි පසුබට නොවිය යුතුයි.

කිරි ගොවියන්ගේ සමූපකාර සංකල්පයෙන් පෙහොසත් වූ ඉන්දියාවේ අමූල් වැනි ව්‍යාපරය මෙන්ම ජනරුකුල සංවිධානයත්, රුපියල් පගේ විප්ලවයට සම්බන්ධ වූ කාන්තාවන් දිගුකල් දිනේවා.

චන්දිමා ජයසේන

2021.12.04



